# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,438 - 2025 පෙබරවාරි මස 07 වැනි සිකුරාදා - 2025.02.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 12 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලනන සහා ඡන්ද ආඥාපනත යටෙත් දැන්වීම්... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 13 |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 පෙබරවාරි 21 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 පෙබරවාරි මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

11 - B 082646 — 5,403 (2025/01)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## මහනුවර මහා නගර සභාවේ තොරතුරු තාක්ෂණ අංශය සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත බාහිර උපදේශක (තොරතුරු තාක්ෂණ) කාර්යයන් ඉටුකර ගැනීමේ සේවය ලබා ගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත බාහිර උපදේශක (තොරතුරු තාක්ෂණ) කාර්යයන් ඉටුකර ගැනීමේ සේවය ලබා ගැනීමට නියමිත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි සේවාවේ නාමය සඳහන් කර 2025.02.21 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**බාහිර උපදේශක (තොරතුරු තාක්ෂණ) කාර්යයන් ඉටුකර ගැනීමේ සේවය**

1. මිලදී ගැනීමට නියමිත සේවාව : බාහිර උපදේශක (තොරතුරු තාක්ෂණ) කාර්යයන් ඉටුකර ගැනීමේ සේවය ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත

2. මාසික දීමනාව : මාසික දීමනාව රු. 150,000 කි. (මසකට දින 21 ක් රාජකාරී ඉටු කිරීම සඳහා)

3. කායික සුදුසුකම් : අදාළ සේවාව ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4. අධ්‍යාපන සුදුසුකම් : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ අනුමත උපාධි ප්‍රධාන ආයතනයක් මගින් තොරතුරු තාක්ෂණය පිළිබඳව මූලික උපාධිය අයදුම්පත් කැඳවනු ලබන දිනට පෙර සාර්ථකව සම්පූර්ණ කර උපාධිය ලබා තිබීම.

5. වෘත්තීය සුදුසුකම් :
   - Integration/Software engineering and involved in Software design/ development, database design,

     Application of Design patterns and performance tuning or various Sofware application products/project using cutting edge technologies.

   - Excellent Capabilities on

     ASP. net, C#, PHP, Java, Javascript, CSS, HTML5/DHTML, Ms, SQL. llS, Windows Form, Android studio, kotlin, APls, Cshtml, bootstap, mySQL, React, Node, js

6. වෙනත් සුදුසුකම් :
   (i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
   (ii) බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් 2024.12.31 දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. වයස : සියලුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 50ට නොවැඩි විය යුතුය.

8. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම් ලත් නිලධාරීන් පහත කොන්දේසිවලට යටත්ව සේවයට තෝරා ගනු ලැබේ.

   1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සේවයේ යොදවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව 01 කි.

   2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරු සේවා සපයා ගැනීම සඳහා යොදවා ගනු ලැබේ.

9. සේවා කොන්දේසි :

1. සේවය සපයා ගැනීමේ කාලය බඳවා ගැනීමේ දින සිට වසරකි. සේවා අවශ්‍යතාවය මත කාලය දීර්ඝ කිරීම නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ඇත.
2. අවශ්‍ය ඕනෑම අවස්ථාවක සේවය අවසන් කිරීමේ බලය නාගරික කොමසාරිස් සතු වේ.
3. තෝරාගත් අයවලුන් යම් අවස්ථාවක සේවයෙන් ඉවත් වේ නම් මාසයකට පෙර දැනුම් දීමක් සිදුකළ යුතුය.
4. මෙම සේවයේ යොදවා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.
5. තෝරාගන්නා අයදුම්කරු මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සමග සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

**සටහන** : මෙම සේවා සපයා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

ඒ. එම්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2025 ජනවාරි මස 29 වැනි දින
මහනුවර මහා නගර සභා කාර්යාලයේ දී ය.

02-28

# පළාත් පාලන නිවේදන

**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව**

ගෝසාතක බලපත්‍ර ලබාදීම සම්බන්ධ විරෝධතා කැඳවීම

**ගෝසාතක ආඥාපනත (272 වැනි අධිකාරිය)**

නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ සඳහන් ගෝසාතකාගාර පවත්වාගෙන යාම සඳහා 2025 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බැවින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු ගෝසාතක ආඥාපනතේ 7(2) වැනි උපවගන්තිය ප්‍රකාරව විරෝධතා කැඳවීමට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ ලේකම් W. A. හිමාලි දිල්රුක්ෂි වන මම 2025/01/07 . දිනැති අංක 2025/6501 දරන තීරණය යටතේ තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මෙම ස්ථානය සඳහා බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එකී විරුද්ධ වීමට හේතු සඳහන් කර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් ඇතුළත ඒ බව ලේඛනගත තැපෑලෙන් මා වෙත එවන මෙන් දන්වා සිටිනු ලැබේ.

ලේකම්,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව.

2025 ජනවාරි මස 07 වැනි දින,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | ඉල්ලුම්කරුගේ නම | ගෝඝාතකාගාරය පිහිටි ස්ථානයේ ලිපිනය |
|---|---|---|
| 01 | එස්. මොහොම්මදු ඉන්දියාස් | අංක 15. දූන්කන්නාගම, දූන්කන්නාව |

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු ගෝඝාතක ආඥාපනතේ (272) අධිකාරියේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය ප්‍රකාරව ගෝ ඝාතක බලපත්‍රයක් අයදුම්කර ඇති ඉහත උපලේඛනයේ සඳහන් ස්ථාන සඳහා එකී බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ගෙන් අයෙක් විරුද්ධ වන්නේ නම් ඒ සඳහා දින 14 ක කාලයක් තුළ විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීමට මා විසින් තීරණය කරමි.

02-05

---

බිබිල ප්‍රාදේශීය සභාව

**විනෝද බදු පැනවීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත සඳහන් තීරණය 2024 ක් වූ ඔක්තෝබර් මස 16 වැනි දින තීරණ අංක 412 යටතේ ගනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

තවද, එකී තීරණයට ඇතුළත් ප්‍රතිශතය සම්බන්ධයෙන් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තිය ප්‍රකාරව ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය දී එකී අනුමැතිය පිළිබඳ නිවේදනයක් *ගැසට් පත්‍රයක* පළ කරන දිනක සිට අදාළ බද්ද බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා බලාත්මක වන බව මෙයින් වැඩිදුරටත් නිවේදනය කරමි.

ඩී. එම්. අනුෂා සුදර්ශනී දිසානායක,
සභා ලේකම්,
බිබිල ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 16 වන දින,
බිබිල ප්‍රාදේශීය සභාවේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව විනෝද බදු ආඥාපනත යටතට ගත හැකි විනෝද සංදර්ශනයක් බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇතුලත් වීම සඳහා මුදල් අයකර සංදර්ශනයක් කර එසේ ඇතුළත් වීම සඳහා අයකර ගන්නා වූ මුදලින් සියයට දහයක් (10%) වශයෙන් වූ ප්‍රතිශතයක් යටතේ විනෝද බද්දක් පනවා අයකළ යුතු බවට තීරණය කරමි.

02-18

---

උඩපළාත ප්‍රාදේශීය සභාව - ගාස්තු සංශෝධනය - 2025 වර්ෂය

අංක 2416/2024 නොවැම්බර් මස 08 වන දින බදු පැනවීමේ *ගැසට් පත්‍රයෙහි* අංක 04 වෙනත් සේවා යටතේ මෘත දේහයක් ආදාහන කිරීමෙන් පසු එම අළු තැන්පත් කිරීමේ ගාස්තුව රුපියල් 1,000.00 ක මුදල 2025/10/06 වන දින කළමනාකරණ කමිටු තීරණ අංක 10 අනුව රුපියල් 10,000.00 වශයෙන් සංශෝධනය කරනු ලබන බව නිවේදනය කර සිටිමි.

එස්. එම්. කේ. ජී. එස්. සුභසිංහ,
ලේකම්,
උඩපළාත ප්‍රාදේශීය සභාව.

02-24